ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2026.03.04

එම්.එච්.එම්.මුබාරක් මයා
අංක 12/3, දෙවනි පටුමග,
දිග්ගල පාර, කෙසෙල් වත්ත,
පානදුර.

*පැමිණිලි පාර්ශවය*

එම්.එම්.එම්.ෆාදීල්
8බී ශ්‍රේණිය
ආරක්ෂක සේවා විද්‍යාලය
කොළඹ 02.

*වින්දිත පාර්ශවය*

එදිරිව

1. පූජ්‍ය ශ්‍රී පුර සරණතිස්ස හිමි
   සිංහල විෂය භාර ගුරු
   ආරක්ෂක සේවා විද්‍යාලය
   කොළඹ 02.

2. විදුහල්පති
   ආරක්ෂක සේවා විද්‍යාලය
   කොළඹ 02.

3. එච්.එච්. පෙරේරා මෙය
   පන්තිභාර ගුරු
   ආරක්ෂක සේවා විද්‍යාලය
   කොළඹ 02 .

*වගඋත්තර පාර්ශවය*

**පැමිණිලි අංකය- එච්.ආර්.සී 2239/25**

**පැමිණිල්ල**

පැමිණිලිකරු විසින් 2025.07.25 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත සවිස්තරාත්මක පැමිණිල්ලක් යොමු කරමින් ඔහුගේ වයස අවුරුදු 12 ක් වූ මොහොමඩ් ෆාදීල් දරුවා කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලයේ 08 වන ශ්‍රේණියේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනුම ලබන බවත්, 2025.07.14 වන දින දරුවා පාසල් ගොස් සිටියදී, එහි ගුරුවරියකගේ දුරකථනයෙන් දරුවාගේ මව වෙත ඇමතුමක් ලබා දී ඇති අතර,



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

එහිදී සිංහල භාෂා ගුරුවරයා දරුවාට අමානුෂික ලෙස පහර දී ඇති බවත් දරුවා දැඩි වේදනාවෙන් පසුවන බවත් දැනුම් දී ඇති බව සඳහන් කර ඇත. ඒ අනුව දරුවා ඔහු රාජකාරි කරනු ලබන පොලිස් රෝහල වෙත කැඳවාගෙන ගොස් පරීක්ෂා කිරීමේදී, දරුවාගේ පිට ප්‍රදේශයේ පහරදීම් නිසා ඇති වූ තුවාල කිහිපයක්, ඒ අවට ඉදිමීම් සහ සුළු වශයෙන් රුධිරය වහනය වීමක් සිදු වී ඇති බව දෙමාපියන් විසින් නිරීක්ෂණය කර ඇත. අනතුරුව දරුවා කොළඹ ජාතික රෝහල වෙත රැගෙන ගොස් ඇති අතර, වැඩිදුර ප්‍රතිකාර සඳහා රිජ්වේ ආර්යා ළමා රෝහල වෙත 2025.07.14 දින ඇඳඉසපත් (BHT) අංක 43815 යටතේ ඇතුළත් කර තිබේ. පසුව 2025.07.15 දින අධිකරණ වෛද්‍ය පෝරම අංක (MLEF) 292/25 අංකය යටතේ දරුවාව අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමට දෙමාපියන් කටයුතු කර ඇත.

මෙම සිදුවීම සම්බන්ධයෙන් දෙමාපියන් විසින් දරුවාගෙන් කරුණු විමසීමේදී ඔහු ප්‍රකාශ කර ඇත්තේ, 2025.07.14 වන දින 05 වන කාලච්ඡේදය තුළ සිංහල භාෂාව සඳහා වූ විවේක කාලයෙන් පසු පන්තියේ අසුන්ගෙන සිටි අවස්ථාවේදී, සිංහල භාෂා ගුරුවරයා පන්තියට පැමිණ පෙර ලබා දී තිබූ කණ්ඩායම් ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් සියලුම දරුවන්ගෙන් විමසීම් කළ බවයි. එය සම්පූර්ණ නොකළ සිසුන්ට ගුරුවරයා වේවැලෙන් පහර දුන් බවත්, පහරදීම සිදු කරන අතරතුර දරුවාගෙන් ද එම කණ්ඩායම් ක්‍රියාකාරකම පිළිබඳව විමසූ බවත්ය. එම අවස්ථාවේදී දරුවා එවැනි කණ්ඩායම් ක්‍රියාකාරකමක් පිළිබඳව නොදන්නා බවත්, තමා පසුගිය සතියේ දින දෙකක් පාසල් නොපැමිණි බවත්, එහෙත් එම දිනවල පාඩම් සටහන් සෙසු සිසුන්ගෙන් ලබාගෙන සම්පූර්ණ කර තිබූ බවත් ප්‍රකාශ කර ඇත. එම කණ්ඩායම් ක්‍රියාකාරකම පිළිබඳව කිසිවෙකු තමා දැනුවත් නොකළ බව දරුවා පවසා තිබේ.

එම අවස්ථාවේදී ගුරුවරයා විසින් *"බූරුවෝ උඹට වැඩ ඉල්ල ගන්න බැරිද අනෙක් යාලුවන්ගෙන්?"* ලෙස බැන වදිමින් දරුවාගේ පිටට වේවැලෙන් පහර දී ඇති අතර, පහරදීමේදී පරුෂ වචන කිහිපයක් ද භාවිතා කර ඇත. එම පහරදීමේ වේදනාව දරාගත නොහැකි වූ දරුවා තමා වාඩි වී සිටි පුටුවටම හේත්තු වී ඇති අතර, එවිට නැවතත් ගුරුවරයා විසින් දරුවාගේ බෙල්ල බංකුව දෙසට ඔබාගෙන තවත් පහරවල් තුනක් වේවැලින්ම එල්ල කර තිබේ. එසේ එල්ල කිරීමේදී දරුවාට ඉන් මිදීමට කිසිදු හැකියාවක් තිබී නොමැති අතර, දරුවා දැඩි වේදනාවෙන් හඬා වැටෙමින් සිටියදී ගුරුවරයා විසින්, *"ගෙදර ගිහින් කලිසම ගලවා බලාපන් උඹ ගැහැනියෙක්ද පිරිමියෙක් ද කියලා. හෙට වරෙන් මම කියන්නම් උඹ ගෑනියෙක්ද පිරිමියෙක් ද කියලා, උඹ වාඩිවෙන්න ඕන තැන මම කියන්නම්"* ලෙස පන්තියේ අනෙක් ළමයින් ඉදිරියේ පවසා ඇති අතර, එලෙස පැවසීමෙන් පසු පන්තියේ අනෙක් සිසුන් දරුවා දෙස බලා හයියෙන් සිනාසුණු බව දරුවා විසින් ප්‍රකාශ කර ඇත.

තවද, මෙම සිදුවීමට පෙර සිටම පන්තිභාර ගුරුවරිය අදාළ සිංහල විෂය භාර ගුරුවරයා සිසුන්ට පහරදීම් සිදු කරන බව දැන සිටි බවට පැමිණිලිකරු චෝදනා කරයි. ඇය විසින් 8-B පන්තිය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන වට්ස්ඇප් (WhatsApp) සමූහයට යොමු කරන ලද පණිවිඩයක් මඟින් ඒ බව සනාථ වන බව පවසන පැමිණිලිකරු, එහි පිටපත් ද සාක්ෂි ලෙස ඉදිරිපත් කර ඇත. රිජ්වේ ආර්යා ළමා රෝහලේ පොලිස් මුරපොල හරහා කොම්පඤ්ඤවීදිය පොලිස් ස්ථානය වෙත මෙම පැමිණිල්ල යොමු කර තිබුණ ද ඒ සම්බන්ධයෙන් සාධාරණයක් ඉටු නොවූ බවත්, 2025.07.17 දින පොලිස් ස්ථානයේ දැනුම් දීම මත එහි ගිය අවස්ථාවේදී විදුහලේ ගුරුවරුන් කණ්ඩායමක් එහි පැමිණ සිටි බවත් සඳහන් කර ඇත. ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපතිවරිය එම පිරිස පෙන්වා දරුවාගෙන් ඔහුට පහර දුන් පුද්ගලයා කවුරුන්දැයි හඳුනා ගැනීමට නිල නොවන හඳුනාගැනීමේ පෙරෙට්ටුවක් පැවැත්වූ බව ද පැමිණිලිකරු චෝදනා කරයි. එම නිලධාරිනිය *"ගෙදර වැඩ නොකිරීම හේතුවෙන් පහර දුන් බව"* පවසමින් සිද්ධිය සාධාරණීකරණය කිරීමට උත්සාහ කළ අවස්ථාවේ පැමිණිලිකරු ඊට විරුද්ධ වී ඇත. එම අවස්ථාවේදී දරුවාට එම පිරිස ඉදිරියේ ප්‍රකාශයක් ලබා දීමට නොහැකි වූ බැවින් ඔවුන් පොලිස් ස්ථානයෙන් පිටතට පැමිණි බවත්, එවිට විදුහලේ සේවය කරන මුස්ලිම් ජාතික ගුරුවරයෙකු පැමිණ මෙය සමථයකට පත් කර ගැනීමට කතා කළ බවත්, විවිධ පුද්ගලයන් පසුව ද දුරකථන මඟින් තමාට කතා කරමින් මෙය සමථයකට පත් කර ගන්නා ලෙස බලපෑම් කළ බව සඳහන් කර ඇත.

මෙම සිදුවීම හේතුවෙන් දරුවා පාසල තුළ විවිධ වෙනස්කොට සැලකීම්වලට ලක්ව ඇති බව ද පැමිණිල්ලේ සඳහන් වේ. ඒ අනුව, පාසල් ජූඩෝ ක්‍රීඩා කටයුතු සඳහා පවත්වාගෙන යනු ලබන වට්ස්ඇප් සමූහයෙන් 2025.07.16 දින දරුවාව ඉවත් කර ඇති බවත්, පන්තිභාර ගුරුවරිය විසින් 8-B පන්තියේ දෙමාපියන් වෙත ලේඛන ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙමින් යොමු කළ පණිවිඩයක සිය දරුවාගේ නම හිතාමතාම ඇතුළත් කර නොතිබීමෙන් එම වෙනස්කොට සැලකීම සනාථ වන බවත් පැමිණිලිකරු සඳහන් කර ඇත. ඒ අනුව, දරුවාගේ මානසික යහපැවැත්ම සහ අධ්‍යාපනික අඛණ්ඩතාව සහතික කරනු පිණිස, ඔහු මේ දක්වා අධ්‍යාපනය ලැබූ ඉංග්‍රීසි මාධ්‍ය පහසුකම් සහිත වෙනත් ආරක්ෂිත සහ සුදුසු පාසලකට කඩිනමින් මාරු කර දෙන ලෙස පැමිණිලිකරු සහනය වශයෙන් අපේක්ෂා කර ඇත.

පැමිණිලිකරු විසින් සිය පැමිණිල්ලේ අන්තර්ගත කරුණු සනාථ කිරීම සඳහා පහත සඳහන් ලේඛනගත සාක්ෂි කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

- මෙම සිදුවීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙස ඉල්ලා 2025.07.25 වන දින කොළඹ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත යොමු කරන ලද ලිපියේ පිටපත.
- මෙම පැමිණිල්ල අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලියාපදිංචි තැපැලෙන් යොමු කළ බව සනාථ කරනු ලබන තැපැල් ලදුපත් ඇතුළු අනෙකුත් තොරතුරු.
- පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2025.08.06 වන දිනැතිව පැමිණිලිකරු වෙත යොමු කරන ලද ලිපියේ පිටපත.
- පන්තිභාර ගුරුවරිය විසින් වට්ස්ඇප් (WhatsApp) මාධ්‍ය ඔස්සේ යොමු කරන ලද පණිවිඩවල පිටපත් සහ සිද්ධියෙන් අනතුරුව දරුවා පාසල් ජූඩෝ කණ්ඩායමේ වට්ස්ඇප් සමූහයෙන් ඉවත් කරන ලද බව සඳහන් තොරතුරු ඇතුළත් ලේඛන.

<u>වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම</u>

**01. පළමු වගඋත්තර - සිංහල විෂය භාර ගුරු පූජ්‍ය ශ්‍රී පුර සරණතිස්ස හිමි**

2025.08.13 වන දින කොමිෂන් සභාවේ පැවති විමර්ශනයට සහභාගී වෙමින් වගඋත්තර පූජ්‍ය ශ්‍රී පුර සරණතිස්ස හිමියන් කරුණු ඉදිරිපත් කරන ලදී. එහිදී උන්වහන්සේ ප්‍රකාශ කර සිටියේ පහරදීම සම්බන්ධයෙන් පැමිණිලිකරු ඉදිරිපත් කර ඇති කාරණා කිසිවක් තමන් වහන්සේ පිළිනොගන්නා බවයි. එසේ වුවද, පොදුවේ ගුරු වෘත්තියේදී සිසුන්ට පහරදීම් සිදුකිරීම වරදක් බව තමන් වහන්සේ පිළිගන්නා බව උන්වහන්සේ සඳහන් කර ඇත.

විමර්ශනයේදී වැඩිදුරටත් කරුණු දැක්වූ වගඋත්තර ස්වාමීන් වහන්සේ, පාසලේ තමන් වහන්සේ උගන්වනු ලබන සෑම පන්තියකම සිසුන්ගේ මට්ටම සහ අඩුපාඩු නිරීක්ෂණය කරමින් ඔවුන්ව දිරිගැන්වීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන බව සඳහන් කර ඇත. එසේම 08-B පන්තියේ සිසුන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන බැවින් ඔවුන්ගේ සිංහල භාෂා දැනුම සහ පාසල් පැමිණීම පවතිනුයේ ඉතා දුර්වල මට්ටමක බවත්, මෙම වින්දිත දරුවා ද පාසල් පැමිණීම අවම සිසුවෙකු බවත් උන්වහන්සේ පෙන්වා දී ඇත. පන්තියේ දෛනික වැඩ කටයුතු හා වැඩපිළිවෙල සමඟ අනුගත නොවන සිසුන් පිළිබඳව නිරන්තරයෙන් සොයා බලන බවත්, සතියකට වරක් සිසුන්ගේ අභ්‍යාස පොත් පරීක්ෂා කර වැඩ අවසන් නොකළ සිසුන් පිළිබඳව පන්තිභාර ගුරුතුමියව දැනුවත් කරන බවයි. එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය 09 වන දින ගුරුවරිය වට්ස්ඇප් (WhatsApp) පණිවිඩයක් යොමු කරන්නට ඇති බවත්, එය කිසිදු අයුරකින් සිසුන් පීඩනයට පත් කිරීමේ අරමුණින් සිදු කළ එකක් නොවන බවත්ය.

විමර්ශනයේදී වැඩිදුරටත් කරුණු දැක්වූ වගඋත්තර ස්වාමීන් වහන්සේ, අදාළ පන්තියේ සෙසු සිසුන් තමන් වහන්සේගේ ඉගැන්වීමේ ක්‍රමවේදය පිළිබඳව මනා අවබෝධයකින් පසුවන බවත්, ඔවුන් ඉතා සහයෝගයෙන් අධ්‍යාපන කටයුතුවල නිරත වන බවත්, තමන් වහන්සේ කිසිදු අවස්ථාවක අමානුෂික ලෙස පහරදීම් සිදු කරන කෲර පුද්ගලයෙකු නොවන බවත්, භික්ෂුවක් වශයෙන් සමාජය සමඟ මෙන්ම සිසුන්

සමඟ ද ඉතා සුහදව සහ සහයෝගයෙන් කටයුතු කරන බව සඳහන් කර ඇත. තව ද පන්ති කාමරය තුළ කිසිදු ජාති හෝ ආගම් භේදයකින් තොරව සියලුම දරුවන්ට සමාන ලෙස සලකන බවත්, එම සමානාත්මතාවය පවත්වා ගැනීම සඳහා පන්තිය ආරම්භයේදී පවා ආගමික ආමන්ත්‍රණ භාවිත නොකිරීමට වගබලා ගන්නා බවයි.

සිද්ධියට අදාළ පසුබිම පැහැදිලි කරමින් උන්වහන්සේ, 2025.07.07 වන දින 'කතරගම පුදබිම' පාඩම පදනම් කරගනිමින් මාතෘකා පහක් යටතේ කණ්ඩායම් ක්‍රියාකාරකමක් සිසුන්ට පවරන ලද බවත්, එදින වින්දිත සිසුවා පාසල් පැමිණ නොසිටි බැවින්, ඔහු පසුව පැමිණි දිනකදී සුදුසු කණ්ඩායමකට අනුයුක්ත කිරීමට තමන් වහන්සේ කටයුතු කළ බවයි. අදාළ ක්‍රියාකාරකම සඳහා සිසුන්ගේ අභ්‍යාස පොත් පරීක්ෂා කරන අවස්ථාවේදී, වින්දිත සිසුවා තමා අයත් කණ්ඩායම පිළිබඳව පවා අවබෝධයක් නොමැතිව සිටි බවත්, පවරන ලද කාර්යයන් සම්පූර්ණ කර නොතිබූ බවත් උන්වහන්සේ පෙන්වා දී ඇත.

එල්ල වී ඇති පහරදීමේ චෝදනාව සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළ වගඋත්තර හිමියන්, මෙය තමන් වහන්සේ අපහසුතාවයට පත් කිරීම සඳහා සිතාමතා ගොතන ලද අසත්‍ය කතාවක් බවත්, සිසුවාගේ පියා විසින් *"ගුරුවරයෙකු පහර දුන්නේ නම් ගැටලුවක් නොමැති බවත්, භික්ෂුවක පහර දීම ප්‍රශ්නයක් බවත්"* පවසමින් මෙම සිද්ධියට ආගමික මුහුණුවරක් දීමට උත්සාහ කර ඇති බව සඳහන් කර ඇත.

මෙම ගැටලුකාරී තත්ත්වය හමුවේ වුවද, පන්තියේ සෙසු සිසුන්ගේ දෙමාපියන් තමන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබා ඇති බවත්, උන්වහන්සේව නැවත පන්තියට කැඳවන ලෙස ඉල්ලමින් අත්සන් කරන ලද ලේඛනයක් පවා ඉදිරිපත් කර ඇති බවත්, තමන් වහන්සේ සිදු නොකළ වරදකට මෙලෙස විවිධ පාර්ශවයන් හරහා චෝදනා එල්ල කිරීම තමන් වහන්සේට දැඩි මානසික පීඩනයක් බව ද වැඩිදුරටත් සඳහන් කර ඇත.

**02. දෙවන වගඋත්තර - විදුහල්පති, කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය**

කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් 2025.08.11 වන දින ඉදිරිපත් කරන ලද ලිඛිත කරුණු දැක්වීම සහ 2025.08.13 වන දින කොමිෂන් සභාවේ පැවති විමර්ශනයේදී සහකාර විදුහල්පති පී.එම්.ආර්. සඳමාලි මහත්මිය කරුණු ඉදිරිපත් කර ඇත.

ආරක්ෂක සේවා විද්‍යාලය 2007 වසරේදී ආරක්ෂක සේවයේ නියුතු සාමාජිකයන්ගේ දරුවන් වෙනුවෙන් ආරම්භ කරන ලද්දක් වන අතර, වර්තමානය වන විට එහි සිසුන් 4000ක් පමණ අධ්‍යාපනය හදාරන බවත් 163ක ගුරු මණ්ඩලයක් සේවය කරන බවත් සඳහන් කර ඇත. විද්‍යාලය සඳහා ගුරු භවතුන් අනුයුක්ත කිරීමේදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විද්‍යාපීඨවලින් පිටවන නවක පත්වීම්ලාභීන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන බවත්, ඒ අනුව 2025 මැයි 02 දින පත්වීම් ලැබූ ගුරු භවතුන් 14 දෙනෙකු අතර මෙම සිද්ධියට අදාළ සිංහල විෂය භාර පූජ්‍ය ශ්‍රී පුර සරණතිස්ස හිමි සහ පන්තිභාර ගුරුතුමිය වන හසකලනී හිමංගනී මෙනවිය ද පසුවන බව දන්වා ඇත.

මොහොමඩ් ෆාදිල් සිසුවා 8-B (ඉංග්‍රීසි මාධ්‍ය) පන්තියේ ඉගෙනුම ලබන අතර, 2025.07.14 වන දින සිසුවා පාසල් පැමිණ සාමාන්‍ය පරිදි අධ්‍යාපන කටයුතුවල නිරතව ඇති බවත්, එදින අටවන කාලච්ඡේදයේ ගණිතය විෂය ඉගැන්වූ නිරෝෂණී පෙරේරා මහත්මිය මඟින් දරුවාගේ මවට ඇමතුමක් ලබාගෙන ඇති නමුත්, සිදුවීම වූ බව කියන පස්වන කාලච්ඡේදයේ සිට අටවන කාලච්ඡේදය දක්වාම දරුවා සාමාන්‍ය පරිදි පන්තියේ රැඳී සිටි බව විෂය භාර ගුරුවරුන් සනාථ කර ඇති බව විදුහල්පතිවරිය සඳහන් කර ඇත. දරුවාට පහර දී ඇති බවට පියා විසින් කරන ලද දැනුම්දීමෙන් පසු, අදාළ පහර දුන් ස්ථානයන්හි ඡායාරූප එවන ලෙස පන්තිභාර ගුරුතුමිය ඉල්ලා සිටියද පියා එය ප්‍රතික්ෂේප කර ඇති බවත්, පාසලේ ක්‍රියාත්මක වෛද්‍ය ඒකකය වෙත දරුවා ඇතුළත් කර නොමැති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

සිද්ධිය පිළිබඳව විදුහල්පතිවරිය වෙත දැනුවත් කර ඇති පරිදි, පස්වන කාලච්ඡේදයේදී සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයෙහි 14 වන "කතරගම පුදබිම්" පාඩමට අදාළව කණ්ඩායම් ක්‍රියාකාරකම සම්පූර්ණ කර ඇති දැයි බැලීමට පූජ්‍ය ශ්‍රී පුර සරණතිස්ස හිමියන් අභ්‍යාස පොත් පරීක්ෂා කර ඇත. මෙම ක්‍රියාකාරකම 2025.07.07 වන දින ලබා දී තිබූ අතර, එදින නොපැමිණි සිසුන් ද පසුව කණ්ඩායම්වලට අනුයුක්ත කර තිබේ. මෙම සිසුවා ද තමා අයත් කණ්ඩායම නොදන්නා බවට "බොරුවක්" පවසා පවරන ලද අභ්‍යාස කිසිවක් සිදු කර නොතිබූ බැවින්, වැඩ නොකළ අනෙකුත් සිසුන්ට මෙන්ම මෙම සිසුවාට ද සුදුසු පරිදි අවවාද උපදෙස් ලබා දුන් බව ගුරුභවතා දන්වා ඇත.

තවද, 2025.07.09 දින වට්ස්ඇප් (WhatsApp) සමූහයට "for your Sinhala subject" ලෙස යොමු කළ කෙටි පණිවිඩය සහ ඒ හා සම්බන්ධ සේයාරුව හුදෙක් හාස්‍යජනක ස්වරූපයකින් සිසුන්ව දිරිගැන්වීම සඳහා සද්භාවයෙන් සිදු කරන ලද්දක් මිස, එහි කිසිදු බිය ගැන්වීමේ හෝ වෙනත් යටි අරමුණක් අන්තර්ගත නොවන බව විදුහල්පතිවරිය සඳහන් කර ඇත. පන්තිභාර ගුරුවරිය නවක නිලධාරිනියක වුවද සිසුන්ගේ ප්‍රගතිය වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කරන බවත්, සිංහල විෂය ඉගැන්වීම මින් පෙර සාර්ථකව සිදු නොවී තිබීම නිසා සිසුන්ගේ දුර්වලතා පිළිබඳව ඇය විෂය භාර ගුරු හිමියන්ව දැනුවත් කර තිබූ බවත් සඳහන් කර ඇත.

2025.07.17 දින කොම්පඤ්ඤ වීදිය පොලිස් ස්ථානයේ පැවති විමර්ශනයට සහකාර විදුහල්පතිතුමිය ඇතුළු පාසල් නියෝජිත පිරිසක් සහභාගී වූ අතර, එහිදී දරුවාගේ පියා ප්‍රකාශයක් ලබා දීම ප්‍රතික්ෂේප කරමින් විමර්ශනය අතරමැද නැගිට පිටව ගිය බවත්, එහිදී පාසලේ ජ්‍යෙෂ්ඨ ගුරුවරයෙකු වන ජෙෆ්රි මහතා (මුස්ලිම් ජාතික) පියා සමඟ සුහදව කතා කර මෙය විසඳා ගැනීමට කළ ආරාධනය මානුෂීය සහ සුහද ඇරයුමක් පමණක් බවත්, එය කිසිසේත්ම අයුතු බලපෑමක් නොවන බවත් සඳහන් කර ඇත. පාසල් සංවර්ධන සමිතිය ද මැදිහත් වී ඇත්තේ පාසලේ කීර්තිනාමය ආරක්ෂා කිරීමට සහ ගැටලුව සුහදව විසඳීමට මිස සිසුවාට අගතියක් කිරීමට නොවන බවයි.

ජූඩෝ ක්‍රීඩාවෙන් දරුවා ඉවත් කිරීම සම්බන්ධයෙන් කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ, මෙම සිසුවා මාස 08ක් පමණ පුහුණුවීම්වලට සහභාගී නොවීම සහ තරග මගහැරීම හේතුවෙන් 2025.07.16 දින පුහුණුකරු විසින් පවත්වාගෙන යනු ලබන පුද්ගලික වට්ස්ඇප් සමූහයෙන් තාවකාලිකව ඉවත් කළ බවයි. එය පවතින විනය නීතිවලට අනුකූලව සිදු වූවක් බවත්, අඩුපාඩු සකසාගෙන නැවත සම්බන්ධ වීමට දරුවාට අවස්ථාව ඇති බවත් සඳහන් කර ඇත.

පැමිණිල්ලේ සඳහන් සිදුවීම වන අවස්ථාවේ විදුහල්පතිවරිය විදේශගතව සිට ඇති අතර, විමර්ශන අවස්ථාවේ දී සහකාර විදුහල්පතිනිය සඳහන් කර ඇත්තේ, නවක ගුරුවරුන් අත්දැකීම් අඩු වුවද දරුවන් කෙරෙහි දෙමාපිය හැඟීමෙන් කටයුතු කරන බවයි. ගුරුවරු ලෙස කිසිදු තැනක දඬුවම් දීම සාධාරණීකරණය නොකරන බවත්ය. දැනට අදාළ ගුරු හිමියන් වෙනත් විද්‍යාලයකට අනුයුක්ත කර ඇති අතර, සිසුවාට පාසල් පැමිණීමට අවශ්‍ය පසුබිම සලසා ඇති බැවින් විද්‍යාලයේ උන්නතිය උදෙසා මෙම කරුණු කෙරෙහි සහනදායී ලෙස සලකා බලන ලෙස ඉල්ලීම් කර ඇත.

**03. තෙවන වගඋත්තර- පන්තිභාර ගුරු හසකලාණි හිමංගන පෙරේරා මෙනවිය**

මෙම සිදුවීම සම්බන්ධයෙන් 2025.08.13 වන දින මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති විමර්ශනයේදී, 08-B ශ්‍රේණියේ වට්ස්ඇප් (WhatsApp) සමූහය වෙත යොමු කරන ලද පණිවිඩය පිළිබඳව ඇය කරුණු ඉදිරිපත් කර ඇත. එහිදී අදාළ සිසුන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන බැවින් ඔවුන් සිංහල විෂය ඉගෙනීමට යම් මැලිකමක් දක්වන බවත්, එම සිසුන් දිරිගැන්වීමේ අරමුණින් තමා විසින් එවැනි පණිවිඩයක් යොමු කළ බවත්, එම පණිවිඩය 2025.07.09 වන දින යොමු කරන ලද්දක් වන අතර, පහරදීමේ සිදුවීම 17 වන දින සිදුවූ බව පවසන බැවින්, මෙම පණිවිඩය අදාළ සිදුවීමට පූර්වයෙන් යොමු කරන ලද්දක් බව ඇය සඳහන් කර ඇත.

සිදුවීම වූ බව කියන දිනයේ පන්තිය තුළ මෙවැනි සිදුවීමක් වූ බවට කිසිදු දරුවෙකු තමා දැනුවත් නොකළ බවත්, ඇය මේ පිළිබඳව දැනගත්තේ 17 වන දින බවත් , ඇය මෙම පහරදීම ඇසින් නොදුටු බැවින්, ඒ පිළිබඳව වැඩිදුර තහවුරු කර ගැනීම සඳහා එදින පස්වරු 2.45 ට පමණ දරුවාගේ පියාට දුරකථනයෙන් ඇමතුමක් ලබා දී අදාළ තුවාලයන්හි ඡායාරූප තමා වෙත යොමු කරන ලෙස දැනුම් දුන් බවත්, එහෙත් මෙතෙක් එම ඡායාරූප තමා වෙත යොමු කර නොමැති බවත් ඇය වැඩිදුරටත් සඳහන් කර ඇත.

<u>අධිකරණ වෛද්‍ය වාර්තාව (Judicial Medical Report)</u>

2025.07.15 වන දින රිජ්වේ ආර්යා ළමා රෝහලේ අංක 07 වාට්ටුවේදී අධිකරණ වෛද්‍යවරයා විසින් වින්දිත දරුවා පරීක්ෂාවට ලක් කර ඇත. එහිදී දරුවා විසින් ලබා දී ඇති රෝග ඉතිහාසය (Short History) පහත පරිදි වාර්තා කර ඇත.

*"ඊයේ 2025.07.14 පෙ.ව. 10.15 ට මගේ පාසලේදී (ආරක්ෂක සේවා විද්‍යාලය, කොම්පඤ්ඤවීදිය) සිංහල විෂය උගන්වන පිරිමි ගුරුවරයෙක් මට වාචිකව හිරිහැර කර මගේ පිටට වේවැලකින් පහර දුන්නා."* (A Male teacher who teach Sinhala subject verbally harassed me and assaulted me with a cane to the back of my chest in my school (Defense Services College, Slave Island) yesterday (14/7/2025) at 10.15 am)

වෛද්‍ය පරීක්ෂණයේදී නිරීක්ෂණය වූ ශාරීරික තත්ත්වයන් සහ තුවාල (Injuries) පිළිබඳව වාර්තාවේ පහත පරිදි සඳහන් වේ.

*"වැදගත් ජීව පරාමිතීන් ස්ථාවර මට්ටමක පවතී. පිටෙහි දකුණු ඉහළ සහ වම් පහළ ප්‍රදේශයන්හි පවතින මෘදු බව (Tenderness) නිරීක්ෂණය විය. මීට අමතරව, වෛද්‍ය වාර්තාවලට අනුව දරුවාගේ පිට ප්‍රදේශයේ වේවැලකින් පහර දීමකදී ඇති විය හැකි සලකුණු (cane marks) දෙකක් දක්නට ලැබුණි."* (Vital parameters are stable. Tenderness over Right upper back of the chest and left lower back of the chest. In addition to that according to the medical records, there were two marks (resembling like cane) found on the back of the chest.)

මෙම තුවාල සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍යවරයාගේ නිගමනය හෙවත් වෛද්‍ය මතය (Medical Opinion) පහත පරිදි වේ.

*"පවතින පරිවේශනීය සාක්ෂිවලට අනුව, දරුවාගේ ශරීරයේ දක්නට ලැබුණු තුවාල රටාව වේවැලකින් පහර දුන් බවට කියනු ලබන සිද්ධිය සමඟ අනුකූල වේ."* (Injury pattern was compatible with the alleged event of assault by cane according to the circumstantial evidence.)

<u>නිරීක්ෂණ</u>

- පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ල මගින්, 2025.07.14 වන දින 08-B පන්තිය තුළදී සිංහල භාෂා ගුරුවරයා විසින් 12 හැවිරිදි සිය පුත්‍රයා වන ෆාදිල් දරුවාට වේවැලකින් පහරදීම සහ සෙසු සිසුන් ඉදිරියේ පරුෂ මෙන්ම අවමන් සහගත වචන භාවිත කරමින් බැණ වැදීම හේතුවෙන්, දරුවා දැඩි ශාරීරික හා මානසික පීඩාවකට පත්ව ඇති බව සඳහන් කර ඇත.

- මෙහිදී පහරදීම සිදු කරන අතරතුර ගුරුවරයා විසින් *"බූරුවෝ, උඹට වැඩ ඉල්ල ගන්න බැරිද"* යනුවෙන් අපහාසාත්මක ලෙස බැණ වැදී ඇති අතර, ඉන් අනතුරුව දරුවා දැඩි ශාරීරික වේදනාවෙන් හඬා වැටෙමින් සිටියදී දරුවාගේ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳව ප්‍රශ්න කරමින්, *"ගෙදර ගිහින් කලිසම ගලවා බලාපන් උඹ ගැහැනියෙක්ද පිරිමියෙක් ද කියලා. හෙට වරෙන් මම කියන්නම් උඹ ගෑනියෙක්ද පිරිමියෙක්*

*ද කියලා, උඹ වාඩිවෙන්න ඕන තැන මම කියන්නම්"* ලෙස පන්තියේ සෙසු සිසුන් ඉදිරියේ සඳහන් කර ඇති බව දරුවා විසින් දෙමාපියන් වෙත සඳහන් කර ඇති බව නිරීක්ෂණය වේ.

- සිංහල විෂය භාර වගඋත්තර ගුරු භික්ෂූන් වහන්සේ විසින් ලබා දෙන ලද ප්‍රකාශය, විදුහල්පතිවරියගේ වාර්තාව සහ සිසුවාගේ දෙමාපියන් පැමිණිල්ල මඟින් ඉදිරිපත් කළ කරුණු සසඳා බැලීමේදී, පන්තියේ සිසුන්ට ලබා දී තිබූ කණ්ඩායම් ක්‍රියාකාරකමක් සම්පූර්ණ නොකිරීම යන කරුණ මත පදනම්ව මෙම දඬුවම් කිරීම සිදු කර ඇති බවට වන සිද්ධිමය පසුබිම දෙපාර්ශවයේම කරුණු අනුව තහවුරු වේ. යම් ශිෂ්‍යයෙකු ලබා දෙන ලද අධ්‍යයන පැවරුම් පිළිබඳව දැනුවත් නොවීම හෝ පවතින විනය දුර්වලතා පිළිබඳව ගුරුවරයෙකු විසින් උපදෙස් ලබා දීම අධ්‍යාපන ක්‍රියාවලියේ සාමාන්‍ය පියවරක් වුවද, ඒ සඳහා ශාරීරික දඬුවම් පැමිණවීම හෝ අවමන් සහගත වචන භාවිත කිරීම ශිෂ්ටසම්පන්න පාලන ක්‍රියාවලියකට කිසිසේත් අනුකූල නොවේ. වගඋත්තරකරුවන් ප්‍රකාශ කරන පරිදි ගුරුවරයාගේ අරමුණ අධ්‍යාපන ප්‍රගතිය හෝ විනය රැකීම වෙනුවෙන් "සද්භාවයෙන්" සිදු වූවක් යැයි සැලකුවද, ඒ සඳහා දඬුවම් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 12/2016 සහ 2012/37 දරන චක්‍රලේඛ විධිවිධාන උල්ලංඝනය කිරීමක් බව නිරීක්ෂණය වේ.

රිජ්වේ ආර්යා ළමා රෝහලේ වෛද්‍ය වාර්තාව සහ අධිකරණ වෛද්‍ය වාර්තා (BHT 43815/ MLEF 292/25) පිරික්සීමේදී, වින්දිත මොහොමඩ් ෆාදීල් දරුවාගේ පිට ප්‍රදේශයේ වේවැල් පහරකට සමාන සලකුණු දෙකක් පවතින බව සඳහන් කර ඇත. එහි වෛද්‍ය මතය ලෙස *"දරුවාගේ ශරීරයේ දක්නට ලැබුණු තුවාල රටාව වේවැලකින් පහර දුන් බවට කියනු ලබන සිද්ධිය සමඟ අනුකූල වේ"(The injury pattern was compatible with the alleged event of assault by cane)* යනුවෙන් සටහන් කර තිබීම තුළින් අදාළ ගුරුවරයා විසින් දරුවාට පහර දී ඇති බව නෛතිකව සනාථ වේ. ඒ අනුව, 2025.07.14 වන දින කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලයේ 08-B (ඉංග්‍රීසි මාධ්‍ය) පන්තිය තුළදී සිංහල භාෂා ගුරු පූජ්‍ය ශ්‍රී පුර සරණතිස්ස හිමියන් විසින් වයස අවුරුදු 12 ක් වූ මොහොමඩ් ෆාදීල් සිසුවාට වේවැලකින් පහර දී ඇති බවට වන කරුණ අධිකරණ වෛද්‍ය වාර්තාව මඟින් තහවුරු වේ.

- පූජ්‍ය ශ්‍රී පුර සරණතිස්ස හිමියන් විසින් මෙම පහරදීමේ චෝදනාව ප්‍රතික්ෂේප කරනු ලැබුවද, *"මේ ළමයාගෙන් ඇහුවාම වැඩ කරාද කියල ඉන්න කණ්ඩායමවත් දන්නේ නෑ කිව්වා. ඒ සිද්ධි දාමයත් එක්ක තමා මේක ඉදිරියට ගියේ"* බවට උන්වහන්සේ විසින් ලබා දෙන ලද ප්‍රකාශය සහ ඉදිරිපත් වී ඇති වෛද්‍ය සාක්ෂි මෙන්ම දරුවා විසින් සිය දෙමාපියන් වෙත සහ අධිකරණ වෛද්‍යවරයා වෙත ලබා දී ඇති සවිස්තරාත්මක ප්‍රකාශ සමඟ සැසඳීමේදී සැලකිය යුතු පරස්පරතාවයක් පෙන්නුම් කරයි. අධිකරණ වෛද්‍ය වාර්තාවේ දැක්වෙන ශාරීරික තුවාල සහ දරුවාගේ ප්‍රකාශය අතර පවතින පැහැදිලි අනුකූලතාවය තුළින් පැමිණිල්ලේ විශ්වාසනීයත්වය තහවුරු වන අතර, වගඋත්තර ගුරුවරයාගේ ප්‍රතික්ෂේප කිරීම කිසිදු සාක්ෂියකින් තහවුරු නොවන හුදු ස්වයං ප්‍රතික්ෂේප කිරීමක් ලෙස නිරීක්ෂණය වේ.

- එමෙන්ම, වින්දිත දරුවා වෙත එල්ල කරන ලද *"ගැහැණියෙක්ද පිරිමියෙක්ද බලපන්"* යන වචන භාවිතය, ලිංගික අර්ථයක් සහිත අවමන් සහගත අදහස් දැක්වීමක් ලෙස සැලකිය හැකිය. මෙවැනි වචන භාවිතය දරුවාගේ පෞද්ගලිකත්වය මෙන්ම ඔහුගේ ස්ත්‍රී පුරුෂ භාවීය ගරුත්වය දරුණු ලෙස උල්ලංඝනය කිරීමකි. මෙය බාලවයස් දරුවකුට සිදුකරන ලද බරපතල මානසික හිංසනයක් මෙන්ම වාචික ලිංගික නින්දාවක් (Verbal sexual humiliation) ලෙස නම් කළ හැකි ක්‍රියාවකි. ඒ අනුව, එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ (UNCRC) 19 වන වගන්තිය සහ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය ප්‍රකාරව මෙය අමානුෂික සහ අපහාසාත්මක සැලකීමක් බව නිරීක්ෂණය වේ.

- අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 2012/37 දරන චක්‍රලේඛය මඟින් ගුරුවරුන්ගේ සදාචාරාත්මක හැසිරීම් පිළිබඳ ආචාර ධර්ම පද්ධතිය හා පොදු නීති මාලාව පැහැදිලිව දක්වා

ඇත. එහිදී දරුවන්ගේ පෞරුෂය පරිපූර්ණ ලෙස සංවර්ධනය කිරීමට දායක වීම සෑම ගුරුවරයෙකුගේම වගකීමක් වන බවත්, ගුරුවරුන් ශිෂ්‍යයන්ගේ 'ස්ථානීය දෙමාපියන්' (In Loco Parentis) නම් වූ නීතිමය සංකල්පයට අනුව ශිෂ්‍ය සුබසාධනය උදෙසා කටයුතු කිරීමට නීත්‍යානුකූලව බැඳී සිටින බවත් අවධාරණය කර ඇත.

කෙසේ වුවද, පන්ති භාර ගුරුතුමිය වන හසකලාණි හිමංගනී මෙනවිය විසින් මෙම පහරදීමේ සිදුවීමට පෙර, එනම් 2025.07.09 වන දින වට්ස්ඇප් (WhatsApp) විද්‍යුත් මාධ්‍ය හරහා යොමු කරන ලද පණිවිඩයේ අන්තර්ගත ඡායාරූපයේ කුඩා දරුවෙකු සැහැල්ලුවෙන් අසුන්ගෙන සිටින අතර, වැඩිහිටියන් දෙදෙනෙකු පොත්පත්වල යමක් ලියන ආකාරය නිරූපණය වේ. එම රූපයට පහළින් *“හරියට ගෙදර වැඩ ටික කරපල්ලා මට බෑ ගුටිකන්න”* යනුවෙන් සඳහන් කර තිබූ අතර, ගුරුවරිය එය සිනාසෙන මුහුණු (Emojis) සහිතව *“for your Sinhala subject”* ලෙස පන්තියේ වට්ස්ඇප් සමූහය වෙත යොමු කර ඇති බව ඉදිරිපත් කර ඇති ලේඛණ මඟින් නිරීක්ෂණය වේ.

විමර්ශන අවස්ථාවේදී මෙන්ම විදුහල්පති විසින් යොමු කරන ලද වාර්තාවන්හි ද සඳහන් කර තිබුණේ, අදාළ පණිවිඩය හුදෙක් හාස්‍යය ජනනය කිරීම සහ සිසුන් අධ්‍යයන කටයුතු සඳහා දිරිගැන්වීමේ අරමුණින් යොමු කළ එකක් බවයි. එහෙත්, එම පණිවිඩය සිංහල විෂය සඳහාම විශේෂයෙන් ඉලක්ක කර යොමු කිරීමත්, එහි සෘජුවම 'ගුටිකෑම' හෙවත් ශාරීරික දඬුවම් පිළිබඳව සඳහන්ව තිබීමත් තුළින්, සිංහල විෂය භාර ගුරුවරයා සිසුන්ට පහර දෙන බවට පන්ති භාර ගුරුතුමිය සතුව පැවති පූර්ව දැනුවත්භාවය මනාව පෙන්නුම් කෙරේ.

පන්ති භාර ගුරුතුමිය ලෙස සිසුන්ගේ ආරක්ෂාව සහතික කිරීමටත්, සිංහල විෂය භාර ගුරුවරයා විසින් සිදු කරනු ලබන මෙම ශාරීරික දඬුවම් පාලනය කිරීමට හෝ ඒ පිළිබඳව විධිමත් පරිදි වාර්තා කිරීමට කටයුතු නොකර, එය හාස්‍යයට ලක් කරමින් සිසුන් තවදුරටත් භීතියට හා පීඩනයට පත් කිරීමට කටයුතු කිරීම වගකීම පැහැර හැරීමකි. ඒ අනුව, පන්ති භාර ගුරුතුමිය සිය ව්‍යවස්ථාපිත වගකීමෙන් බැහැරව කටයුතු කිරීම මඟින් අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 12/2016 සහ 2012/37 දරන චක්‍රලේඛ විධිවිධාන උල්ලංඝනය කර ඇති බව නිරීක්ෂණය වේ.

- විදුහල්පතිවරිය මෙම සිදුවීම සිදුවන අවස්ථාවේ විදේශගතව සිටියද, පසුව ඒ පිළිබඳව දැනුවත් වූ බව සඳහන් කර ඇත. එහෙත්, ගුරුවරයා විසින් සිදුකරන ලදැයි කියන පහරදීම සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර විමර්ශනයක් පැවැත්වීමට, ඒ පිළිබඳව ඉහළ බලධාරීන් දැනුවත් කිරීමට හෝ වින්දිත දරුවාගේ උපරිම යහපත *(Best interest of the child)* තහවුරු කිරීම උදෙසා කිසිදු ප්‍රමාණවත් පියවරක් ගෙන නොමැති බව නිරීක්ෂණය වේ.

විදුහල්පතිවරිය විසින් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද වාර්තාවේ, *“2025. 07.14 වන දින අභ්‍යාස පොත් බැලීමේ දී පොතෙහි අඩුපාඩු සහිත සිසුන්ට හා වැඩ නොකළ සිසුන්ට සුදුසු පරිදි අවවාද උපදෙස් ලබාදීම සිදුකර ඇති අතර ඒ අතර මෙම සිසුවාද ඇතුළත්ව ඇති බව සහ මෙම සිසුවා ඔහු අයත් කණ්ඩායම නොදන්නා බවට බොරුවක් ද පවසා පවරන ලද අභ්‍යාස කිසිවක් සිදු කර නොමැති බව”* සඳහන් කර ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 12/2016 දරන චක්‍රලේඛය මඟින් සිසුන්ගේ අයෝග්‍ය චර්යාවන් වැළැක්වීම සඳහා ශාරීරික වේදනාවක් ඇති වන අන්දමින් කරනු ලබන දඬුවම් "ශාරීරික දඬුවම්" ලෙස පැහැදිලිව අර්ථ දක්වා ඇත. සිසුවා තුළ චර්යාමය වෙනසක් ඇති කිරීමේ චේතනාවෙන්, සද්භාවයෙන් යුතුව වුවද කිසිදු ශිෂ්‍යයෙකුට ශාරීරිකව පීඩනයක් විය හැකි ආකාරයේ දඬුවම් ලබාදීමෙන් ගුරුවරුන් වැළකී සිටිය යුතු බව එම චක්‍රලේඛය මඟින් අවධාරණය කර තිබියදී, විදුහල්පතිනිය මෙම පහරදීම *“සුදුසු පරිදි අවවාද උපදෙස් දීමක්”* ලෙස අර්ථකථනය කිරීමට උත්සාහ කර ඇති බව නිරීක්ෂණය වේ. මෙලෙස සිදු වූ පහරදීම සාධාරණීකරණය කිරීම තුළින් අංක 12/2016 චක්‍රලේඛය සම්බන්ධයෙන් තමා සතු වගවීම මඟහැරීමට ඇය උත්සාහ කර ඇති බවත්, පන්ති කාමරය තුළ සිදුව ඇති මෙම හිංසනය නොසලකා හරිමින් වින්දිත දරුවා වෙතම චෝදනා එල්ල කිරීමට කටයුතු කර ඇති බවත් නිරීක්ෂණය වේ.

ගුරුවරුන් සතු වගකීමක් වන දරුවන්ට ආරක්ෂිත අධ්‍යාපන වටපිටාවක් සැපයීම මෙම පාසල තුළ ගිලිහී ගොස් ඇති බව නිරීක්ෂණය වන පසුබිමක, දරුවන් පාලනය කිරීමේ අරමුණින් සිදු කරන මෙම දඬුවම් කිරීම් සුදුසු අවවාද සහ උපදෙස් ලෙස විදුහල්පතිවරිය සලකා ඇත. පාසල තුළ අත්දැකීම් අඩු නවක ගුරුවරුන් ඉගැන්වීමේ කටයුතු සිදුකරන බවට විදුහල්පතිවරිය සඳහන් කළ ද, අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයන්ගෙන් නවක ගුරුවරුන් බැහැර නොවන අතර, පවතින නීති හා රෙගුලාසි පිළිබඳව ගුරුවරුන් නිසි පරිදි දැනුවත් කිරීමටත්, ඔවුන්ගේ ක්‍රියාකලාපයන් පිළිබඳව විධිමත් අධීක්ෂණයක් සිදු කිරීමටත් වගඋත්තර විදුහල්පතිවරිය අපොහොසත් වී ඇති බව මෙම කරුණු මඟින් පිළිබිඹුවේ.

- විදුහල්පතිවරිය විසින් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද වාර්තාව මඟින් අවස්ථා කිහිපයකදීම මෙම විද්‍යාලය ආරක්ෂක අංශ සාමාජිකයන්ගේ දරුවන් අධ්‍යාපනය ලබන සුවිශේෂී පාසලක් බව ඉස්මතු කර ඇති අතර, සිසුන්ගේ අධ්‍යයන දුර්වලතා හමුවේ ලබා දෙන දඬුවම් ඔවුන්ගේ *"අභිවෘද්ධිය උදෙසා කරනු ලබනක්"* ලෙස සාධාරණීකරණය කිරීමට උත්සාහ කර ඇති බව පෙනී යයි. එසේම, මෙම සිදුවීමෙන් පාසලේ කීර්තිනාමයට විය හැකි හානිය වැළැක්වීමට සහ ගුරුවරුන්ගේ ගෞරවය ආරක්ෂා කර ගැනීමට *"සුහදව සාකච්ඡා කර විසඳා ගැනීමට"* කරන ලද යෝජනාව මානුෂීය සහ සුහද ඇරයුමක් ලෙස හුවා දක්වා ඇත. එහෙත්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 12/2016 සහ 2012/37 දරන චක්‍රලේඛ මඟින් ඕනෑම තත්ත්වයක් යටතේ සිසුන්ට ශාරීරික හෝ මානසික පීඩාවක් වන අයුරින් දඬුවම් පැමිණවීම සපුරා තහනම් කර ඇති පසුබිමක, පාසල් පරිපාලනය එම ව්‍යවස්ථාපිත රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය වේ.

- එමෙන්ම, මෙම සිදුවීමේදී වින්දිත දරුවා මුස්ලිම් ජාතිකයෙකු වීම සැලකිල්ලට ගෙන, පාසලේ ජ්‍යෙෂ්ඨ මුස්ලිම් ජාතික ගුරුවරයෙකු මෙන්ම ඉහළ නිලතල දරන දෙමාපියන් මැදිහත් කරවා ගනිමින් වින්දිත දරුවාගේ දෙමාපියන් සමඟ සමථයකට එළඹීමට පාසල් බලධාරීන් උත්සාහ කර ඇති බව නිරීක්ෂණය වේ. මෙම මැදිහත්වීම් සියල්ලම පාසලේ කීර්තිනාමය ආරක්ෂා කර ගැනීම මූලික කරගනිමින් සිදු වී ඇති අතර, කිසිදු අවස්ථාවක වධහිංසාවට ලක් වූ දරුවා සම්බන්ධයෙන් සංවේදීව හෝ වගකීම් සහගතව කටයුතු කිරීමට පාසල් පරිපාලනය උත්සාහ දරා නොමැත. විනය පාලනයේ මුවාවෙන් සිදු කළ මෙම ක්‍රියාව හුදු පරිපාලනමය ගැටලුවක් ලෙස සලකා සමථයකට පත් කිරීමට උත්සාහ කිරීම තුළින් දරුවාගේ *"උපරිම යහපත" (Best interests of the child)* පිළිබඳ මූලධර්මය සහ ඒ හා බැඳුණු අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව නිරීක්ෂණය වේ.

- විදුහල්පතිනිය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සමඟ 08-B ශ්‍රේණියේ සිසුන්ගේ දෙමාපියන් 23 දෙනෙකු විසින් අත්සන් කරන ලද 2025.08.07 දිනැති ලේඛනයක් ද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එමඟින් අදාළ වගඋත්තර ස්වාමීන් වහන්සේව නැවත පන්තියට කැඳවන ලෙසත්, පන්තියේ සිදු වූ සිද්ධිය සිය දරුවන්ගේ අධ්‍යාපනයට බාධාවක් නොවන බවත් එම දෙමාපියන් සඳහන් කර ඇත. මෙහිදී විශේෂයෙන්ම නිරීක්ෂණය වන්නේ, පන්ති කාමරය තුළ දරුවා වධහිංසාවට ලක්වීමෙන් පසුව, වින්දිත දරුවා සහ ඔහුගේ දෙමාපියන් අනෙක් සමවයස් සිසුන්ගෙන් සහ දෙමාපියන්ගෙන් බහිෂ්කරණයට මෙන්ම දැඩි විවේචනයට ද ලක්ව ඇති බවයි. වගඋත්තර ගුරුවරයා විසින් සිදු කරන ලද එම අමානුෂික ක්‍රියාව සහ චක්‍රලේඛ උල්ලංඝනය කිරීම් අනෙක් දෙමාපියන් විසින් ලිඛිතවම සාධාරණීකරණය කිරීමට උත්සාහ කිරීම තුළින් වින්දිත දරුවා තවදුරටත් මානසික පීඩනයට සහ අපහසුතාවයට පත් කර ඇති බව නිරීක්ෂණය වේ.

- වින්දිත ෆාදිල් දරුවා 2025.07.16 දින පාසලේ ජූඩෝ ක්‍රීඩා වට්ස්ඇප් (WhatsApp) සමූහයෙන් ඉවත් කර ඇති බවට ඉදිරිපත් වූ කරුණු පාසල් පරිපාලනය විසින් ද සනාථ කර ඇත. මෙම පහරදීමේ සිදුවීම හේතුවෙන් දරුවා පාසල් නොපැමිණෙන අතරතුරදී සහ ඒ පිළිබඳව පොලිස් පරීක්ෂණයක් සඳහා 2025.07.16 දින කැඳවීම් කර තිබියදී, එදිනම දරුවා ක්‍රීඩා සමූහයෙන් ඉවත් කිරීම මඟින් දරුවා සහ දෙමාපියන් තුළ මෙවැනි සාධාරණ සැකයක් ඇති කිරීමට හේතු වී තිබේ. ක්‍රීඩා පුහුණුකරුවන්ගේ තීරණ සම්බන්ධයෙන් පාසල් පරිපාලනය වගකීමෙන් බැහැර වීම කිසිසේත් අනුමත කළ නොහැකි අතර, දරුවාගේ "උපරිම යහපත" පෙරදැරි කරගෙන එවැනි සංවේදී තත්ත්වයන් කළමනාකරණය කිරීමට

විදුහල්පතිවරිය ඇතුළු පාලනාධිකාරිය අපොහොසත් වී ඇති බව පෙනී යයි. එමෙන්ම, පාසලේ ක්‍රීඩා කටයුතුවල නිරත වන සිසුන්ගේ ආරක්ෂාව සහ සහභාගීත්වය අධීක්ෂණය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් පාසල සතුව නොමැති බව ද මෙහිදී නිරීක්ෂණය වේ.

- පන්ති භාර ගුරුතුමිය විසින් ලිපිගොනු භාර නොදුන් සිසුන්ගේ නාමලේඛනය වට්ස්ඇප් සමූහයට යොමු කිරීමේදී ෆාදිල් දරුවාගේ නම හිතාමතාම මඟහැරීම තුළින් දරුවා සමාජීය හා මානසික වෙනස්කොට සැලකීමකට ලක් කර ඇති බව ගම්‍ය වන හෙයින්, මෙම තත්ත්වය දරුවාගේ මූලික අධ්‍යාපන අයිතියට, ආත්ම අභිමානයට සහ මානසික සෞඛ්‍යයට සෘජු තර්ජනයක් වී ඇති බැවින් දෙමාපියන් විසින් දරුවා නැවත එම පාසල වෙත නොයැවීමට තීරණය කර ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2025.08.06 දිනැති ලිපිය මඟින් වගඋත්තර ස්වාමීන්වහන්සේ වෙනත් පාසලකට අනුයුක්ත කර ඇති බව දන්වා තිබුණ ද, වින්දිත දරුවාට නව පාසලක් ලබා ගැනීම සඳහා සාමාන්‍ය චක්‍රලේඛ විධිවිධාන යටතේ අයදුම් කරන ලෙස දැන්වීම වින්දිතභාවයට පත් වූ දරුවෙකු සම්බන්ධයෙන් ප්‍රමාණවත් මැදිහත්වීමක් නොවන බව පෙනී යයි. එමඟින් දරුවාගේ අඛණ්ඩ අධ්‍යාපනය සහතික කිරීම සඳහා අධ්‍යාපන බලධාරීන් සතු වගකීම විධිමත්ව ඉටු කිරීම සඳහා නිසි අවධානයක් යොමු කර නොමැති බව ද නිරීක්ෂණය වේ.

- අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ආයතන අතිරේක ලේකම්වරයා විසින් නිකුත් කරන ලද අංක ED/01827/04/02/2025(4) සහ 2025.08.12 දිනැති ලිපිය මඟින්, පළමුවන වගඋත්තර පූජ්‍ය ශ්‍රී පුර සරණතිස්ස හිමියන්ව කොටහේන මධ්‍ය මහා විද්‍යාලය වෙත තාවකාලිකව අනුයුක්ත කර ඇති බව නිරීක්ෂණය වේ. එම ලිපියට අනුව, විදුහල්පතිගේ නිර්දේශය මත වහාම ක්‍රියාත්මක වන පරිදි නැවත දැනුම් දෙන තුරු සේවා අවශ්‍යතා මත මෙම අනුයුක්ත කිරීම සිදු කර ඇත. එහිදී උන්වහන්සේගේ නිත්‍ය සේවා ස්ථානය කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය ලෙසම පවතින බවත්, වැටුප් ගෙවීම් ද එම විද්‍යාලය හරහාම සිදු විය යුතු බවත් සඳහන් කර තිබීම තුළින් පෙනී යන්නේ මෙය හුදු තාවකාලික පරිපාලනමය පියවරක් පමණක් වන බවයි.

- 2026.01.26 වන දින පවත්වන ලද විමර්ශනයේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ශාඛාව නියෝජනය කළ නියෝජ්‍ය අධ්‍යක්ෂවරිය, පැමිණිලිකරු වෙත සුදුසු පාසලක් ලබාගැනීම සඳහා කලාප අධ්‍යාපන කාර්යාලය හරහා කටයුතු කරන ලෙස අමාත්‍යාංශය විසින් ලිඛිතව දැනුවත් කර ඇති බවත්, එහිදී යම් ගැටලුවක් පැනනගින්නේ නම් ඒ පිළිබඳව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා දැනුවත් කිරීමේ හැකියාව පවතින බවත්, 2026 අධ්‍යයන වර්ෂය සඳහා ඉදිරියේදී ප්‍රකාශයට පත් කිරීමට නියමිත පුරප්පාඩු මත පදනම්ව, පැමිණිලිකරුගේ අභිමතය පරිදි ජාතික පාසලක් වෙත අයදුම් කිරීමට අවස්ථාව පවතින බවත් සඳහන් කර ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ එම කරුණු දැක්වීමට ප්‍රතිචාර දක්වමින් පැමිණිලිකරු අවධාරණය කර ඇත්තේ, තම දරුවා මෙම සිදුවීම තුළ වින්දිතභාවයට පත්ව ඇති බැවින්, සාමාන්‍ය ක්‍රමවේදය යටතේ නැවතත් කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ගොස් ඉල්ලීම් කිරීමට හෝ පුරප්පාඩු මත පදනම්ව අයදුම්පත් ඉදිරිපත් කිරීමට තමා සූදානම් නොමැති බවයි. තම දරුවාට සිදුව ඇති අසාධාරණය සහ ඉන් ඇති වූ මානසික කම්පනය සැලකිල්ලට ගෙන, දරුවාගේ අධ්‍යාපන අඛණ්ඩතාව සහතික කිරීම සඳහා සුදුසු පාසලක් ලබාදීමේ පූර්ණ වගකීම රජය සහ අදාළ අධ්‍යාපන බලධාරීන් සතු විය යුතු බව පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත. කෙසේ වුවද, පැමිණිලිකරු විසින් සිදු කරන ලද මෙම කරුණු දැක්වීම දරුවාගේ අනාගත අභිවෘද්ධිය උදෙසා පියෙකු ලෙස සිදු කරන ලද පුළුල් අදහස් දැක්වීමක් ලෙස නිරීක්ෂණය නොවන අතර, එය මෙම සිදුවීමට අදාළව ආවේගාත්මක ප්‍රකාශයක් ලෙස සැලකිය හැකි බව ද පෙනී යයි.

- 2026.01.21 වන දින පවත්වන ලද විමර්ශනය සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරිය, මෙම කාරණය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ලිඛිත දැනුම්දීම් හෝ සිතාසි තම කාර්යාලය වෙත ලැබී නොමැති බව ප්‍රකාශ කර ඇත. එසේ

වුවද, අදාළ දරුවාට ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය හැදෑරීමට පහසුකම් සහිත පාසලක් ලබා දීමට කටයුතු කරන බවත්, ඒ අනුව පාසල් පද්ධතිය තුළ පවතින පුරප්පාඩු සංඛ්‍යාව තහවුරු කර ගැනීමෙන් පසු දින 03ක් ඇතුළත ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කරන බවටත් ඇය විසින් එහිදී එකඟතාවයක් පළ කර ඇත. නමුත්, විමර්ශනයේදී ලබා දුන් එම එකඟතාවය ප්‍රකාරව කටයුතු කිරීමට කලාප අධ්‍යාපන බලධාරීන් මෙතෙක් අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම, වධහිංසාවට ලක්ව වර්තමානය වන විටත් පාසල් අධ්‍යාපනය අහිමි වී සිටින දරුවෙකු සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන කාර්යාලය මෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය ද දැක්විය යුතු අවධානය සහ වගවීම ප්‍රමාණවත් මට්ටමක පවතින බවක් පෙනී නොයයි. දරුවාගේ අධ්‍යාපන අයිතිවාසිකම් තහවුරු කිරීම උදෙසා වඩාත් විධිමත් හා වගකීම් සහගත මැදිහත්වීමක් සිදු කිරීමට අදාළ ආයතන අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය වේ.

- 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනතේ 308 (අ) වගන්තිය ප්‍රකාරව ළමයින් කෲරත්වයට භාජනය කිරීම නීති විරෝධී සහ දණ්ඩනීය වරදකි. එමෙන්ම, 311 (ඇ) වගන්තිය සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රඥප්තියේ (UNCRC) පළමුවන වගන්තිය මඟින් වයස අවුරුදු 18 ට අඩු සෑම පුද්ගලයෙකුම "ළමයෙකු" ලෙස අර්ථ දක්වා ඇති අතර, ඔවුන් වෙත එම ප්‍රඥප්තියේ සඳහන් සියලුම මූලික අයිතිවාසිකම් හිමි විය යුතුය. ඒ අනුව, වින්දිත මොහොමඩ් ෆාදිල් දරුවා වයස අවුරුදු 12ක පසුවන්නෙකු බැවින්, ඔහු ඉහත සඳහන් සියලුම දේශීය හා ජාත්‍යන්තර නෛතික ආරක්ෂාවන් සහ හිමිකම් ලැබීමට පූර්ණ අයිතිය සහිත දරුවෙකු වේ.

- ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා අපරානුමත කරන ලද 1989 ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (UNCRC) 28(2) වගන්තිය මඟින්, පාසල් තුළ විනය පාලනය කිරීමේ ක්‍රියාවලිය සෑම විටම දරුවාගේ මානව ගෞරවයට හා අභිමානයට අනුකූල වන පරිදි සිදු කළ යුතු බව අවධාරණය කර ඇත. මෙම ජාත්‍යන්තර මූලධර්මය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද අංක 12/2016 දරන චක්‍රලේඛයේ 2.2 උප වගන්තිය මඟින් ද දේශීය නෛතික රාමුව තුළ පිළිගෙන තහවුරු කර තිබේ.

ඒ අනුව, ළමයින්ට එරෙහිව සිදු කෙරෙන කිසිදු ආකාරයක ශාරීරික හෝ මානසික හිංසනයක් වළක්වා ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මඟින් පනවා ඇති ප්‍රමිතීන්ගෙන් බැහැර වීමට කිසිදු ව්‍යතිරේකී තත්ත්වයකට ඉඩ නොලැබෙන බවත්, එම ආරක්ෂාව සම්මුතියේ 19 වන වගන්තිය මඟින් තවදුරටත් ප්‍රතිඥා දී ඇත.

මෙවැනි පැහැදිලි නෛතික පසුබිමක් පවතින පසුබිමක, මෙම විමර්ශනයේදී ඉදිරිපත් වූ සාක්ෂි, වෛද්‍ය වාර්තා සහ සිද්ධිමය සාධක මඟින් පැහැදිලිවම අනාවරණය වන්නේ පළමුවන වගඋත්තර පූජ්‍ය ශ්‍රී පුර සරණතිස්ස හිමියන් විසින් වින්දිත දරුවාට ශාරීරික වධහිංසාවක් සිදු කර ඇති බවයි.

- ශාරීරික දඬුවම් පැමිණවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ උත්තරීතර අධිකරණය ලබා දී ඇති තීන්දු පිරික්සීමේදී, _හේවා මද්දුමගේ කරුණාපාල එදිරිව ඒ. ජයන්ත ප්‍රේම කුමාර සිරිවර්ධන [SC FR /97/2017]_ දරන නඩු තීන්දුව වැදගත් වේ. එම නඩුවේදී, පාසල් විනය භාර ගුරුවරයෙකු විසින් ශිෂ්‍යයෙකුගේ වම් කනට සිදු කරන ලද පහරදීමක් හේතුවෙන් එම දරුවාගේ ශ්‍රවණ ශක්තිය ස්ථිරවම අහිමි වී තිබූ අතර, එකී ක්‍රියාව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය යටතේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන ලදී.

එම නඩු තීන්දුව මඟින් අධිකරණය වැඩිදුරටත් අවධාරණය කර සිටියේ, ශාරීරික දඬුවම් පැමිණවීම කිසිදු අයුරකින් *"විනය පාලනය කිරීමේ ක්‍රියාවලියක්"* ලෙස පිළිගත නොහැකි බවයි. එවැනි අමානුෂික විනය පරිචයන් අධ්‍යාපන පද්ධතියෙන් මුලිනුපුටා දැමීම රජය සතු සෘජු වගකීමක් බව ද එහිදී පෙන්වා දෙන ලදී. ඒ අනුව, දරුවෙකුට එරෙහිව සිදු කෙරෙන ශාරීරික හිංසනය පමණක් නොව, එමඟින් දරුවා වෙත ඇති කරනු ලබන මානසික හානිය ද නීතිය හමුවේ දැඩිව සලකා බැලිය යුතු නීති විරෝධී ක්‍රියාවක් බව මෙම

පූර්වාදර්ශය මඟින් තහවුරු කර ඇත. මෙම නෛතික ස්ථාවරය වර්තමාන පැමිණිල්ලේ සඳහන් වින්දිත දරුවාට සිදු වූ අගතිය සම්බන්ධයෙන් ද සෘජුවම අදාළ වේ.

- *<u>සිල්වා එදිරිව සභාපති, පොහොර සංස්ථාව (1989) 2 SLR 393</u>* යන නඩුවේදී අධිකරණය විසින් ලබා දී ඇති තීන්දුවට අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති ආරක්ෂාව හුදෙක් ශාරීරික ප්‍රචණ්ඩත්වයට පමණක් සීමා නොවේ. එම ව්‍යවස්ථාවේ විෂය පථය පුද්ගලයෙකුගේ ආත්මය, මානසිකත්වය සහ අභ්‍යන්තර පෞරුෂයට එල්ල වන බලපෑම් ද ආවරණය වන පරිදි පුළුල්ව අර්ථ දක්වා ඇත. ඒ අනුව, පුද්ගලයෙකු වෙත එල්ල වන වාචික හෝ මානසික පීඩාව ද 11 වන වගන්තිය යටතේ වන මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් ලෙස සැලකිය හැකි බව තහවුරු වේ.

- *<u>විජේසිංහ චූලංගනී එදිරිව වරුණි බෝගහවත්ත (SC FR App No. 677/2012)</u>* නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දරුවන්ට සිදුවන හිංසනයන් සම්බන්ධයෙන් සුවිශේෂී නිරීක්ෂණයක් සිදු කර ඇත. එහිදී දක්වා ඇත්තේ, සාමාන්‍යයෙන් 11 වන වගන්තිය උල්ලංඝනය වීමක් ලෙස සැලකීමට "බරපතල මට්ටමේ හිංසනයක්" පැවතිය යුතු වුවද, වැඩිහිටියෙකුට අදාළ වන එම නිර්ණායකය සෑම විටම බාලවයස්කරුවෙකුගේ මානසික තත්ත්වය හා සමපාත නොවන බවයි. එහිදී අධිකරණය වැඩිදුරටත් පහත පරිදි අවධාරණය කර ඇත.

*"...එබැවින්, බාලවයස්කරුවෙකු විසින් අවමන් සහගත සැලකීම් පිළිබඳව පැමිණිලි කරන අවස්ථාවක, 'ඉහළ භාරකරු' ලෙස කටයුතු කරන අධිකරණය, අදාළ ක්‍රියාව ඉහත කී 'බරපතල හිංසන මට්ටම' සපුරා නොමැති බව පවසමින් එම පැමිණිලි ප්‍රතික්ෂේප කිරීමට හදිසි නොවිය යුතුය. ඒ වෙනුවට, චෝදනා එල්ල වී ඇති ක්‍රියාව මඟින් අදාළ දරුවාගේ මානසිකත්වයට සහ වර්ධනයට සිදු වී ඇති බලපෑම පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතුය."*

- **<u>පරාක්‍රමගේ ඩග්ලස් බණ්ඩාර එදිරිව එස්. වික්‍රමසිංහ සහ තවත් අය (SC Application No. 190/94)</u>** නඩු තීන්දුව ද මෙම සිදුවීමට සෘජුවම අදාළ වේ. එහිදී සුභූති විද්‍යාලයේ ශිෂ්‍යයෙකුට ගුරුවරුන් විසින් පහර දීම සහ "තමුසේ" වැනි වචන භාවිත කරමින් ප්‍රසිද්ධියේ අපහාස කිරීම හේතුවෙන් එම දරුවා බරපතල මානසික බිඳවැටීමකට ලක්ව මාසයක් පුරා මානසික රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා තිබුණි. එහිදී අධිකරණය තීරණය කළේ ගුරුවරුන් විනය පාලනය කිරීමට උත්සාහ කරන අවස්ථාවන්හිදී ක්‍රියා කරන්නේ රජයේ නිල බලය යටතේ බැවින්, ඔවුන් සිදු කරන මානසික හා ශාරීරික හිංසනයන් සඳහා රජය සහ අදාළ නිලධාරීන් වගකීමට බැඳී සිටින බවයි.

ඉහත සඳහන් සියලුම ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවලට අනුව, මෙම සිදුවීමේදී ද වින්දිත දරුවා වෙත එල්ල කරන ලද ශාරීරික පහරදීම මෙන්ම, පන්ති කාමරය තුළදී සිදු කරන ලද ලිංගිකත්වය පදනම් කරගත් අවමන් සහගත ප්‍රකාශයන් හරහා දරුවාගේ ආත්ම අභිමානයට හා මානසිකත්වයට සිදු වූ අගතිය, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය යටතේ ගැනෙන "කෲර, අමානුෂික සහ අවමන් සහගත සැලකිල්ලක්" ලෙස සැලකිය හැකිය.

<u>නිගමනය</u>

ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ (Convention on the Rights of the Child – CRC) පාර්ශවකරුවෙකු ලෙස, දරුවන්ගේ මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමටත්, ඔවුන්ට වධහිංසාවෙන් තොර ආරක්ෂිත අධ්‍යාපන පරිසරයක් සහතික කිරීමටත් නීතිමය වශයෙන් බැඳී සිටියි. එමෙන්ම, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 12/2016 සහ 2012/37 දරන චක්‍රලේඛ මඟින් පාසල් පද්ධතිය තුළ ශාරීරික දඬුවම් පැමිණවීම සපුරා තහනම් කර ඇති අතර, විනය පාලනය සඳහා විකල්ප සහ අර්ථවත් ධනාත්මක ක්‍රමවේද භාවිතා කිරීමට ගුරුවරුන් වෙත උපදෙස් ලබා දී ඇත.

මෙවැනි නීතිමය හා ප්‍රතිපත්තිමය පසුබිමක් පවතිද්දී, කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලයේ 08-B පන්තියේ ඉගෙනුම ලබන දොළොස් හැවිරිදි මොහොමඩ් මුබාරක් මොහොමඩ් ෆාදිල් යන වින්දිත දරුවාට, 2025.02.14 වන දින සිංහල විෂය භාර ගුරුවරයා ලෙස කටයුතු කළ පළමුවන වගඋත්තර පූජ්‍ය ශ්‍රී පුර සරණතිස්ස හිමියන් විසින් වේවැලකින් පහර දී ඇති බවත්, එමගින් දරුවාට ශාරීරික හානි සිදුවී ඇති බවත් අධිකරණ වෛද්‍ය වාර්තාව මගින් තහවුරු වේ.

මෙම සිදුවීමට අදාළ කරුණු විමර්ශනය කිරීමේදී, පළමුවන වගඋත්තරකරුගේ ක්‍රියාවන් තුළ වධහිංසාවක හෝ කෲර, අමානුෂික සැලකිල්ලක මූලිකාංගයන් සැපිරී ඇති බව නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම, නියම කරන ලද කණ්ඩායම් ක්‍රියාකාරකමක් පිළිබඳව තමා නොදන්නා බව පැවසීම සහ එම පැවරුම සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම යන කරුණු පදනම් කරගනිමින්, වින්දිත දරුවාට වේවැලකින් පහර දීම මගින් ශාරීරික හා මානසික පීඩාවක් ඇති කර තිබීම ද, එම ක්‍රියාව දඬුවම් කිරීමේ ඍජු චේතනාවෙන් සිදු කර තිබීම ද, සහ අදාළ විෂය භාර ගුරුවරයා ලෙස තමා සතු නිල අධිකාරී බලය අයුතු ලෙස භාවිතා කරමින් පහරදීම හා අවමන් සහගත වචන භාවිතයෙන් දරුවා පීඩාවට පත් කිරීම ද යන කරුණු මෙහිදී අනාවරණය වේ. ඒ අනුව, වධහිංසාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ තදබල පීඩාව ඇති කිරීම, දඬුවම් කිරීමේ පරමාර්ථය සහ අධිකාරී බලයක් සහිත පුද්ගලයෙකු ලෙස එම ක්‍රියාව සිදු කිරීම යන මූලික සාධක මෙම සිදුවීම තුළ සම්පූර්ණ වී ඇති බව පෙනී යයි.

ඉහත කරුණු අනුව, පළමුවන වගඋත්තර පූජ්‍ය ශ්‍රී පුර සරණතිස්ස හිමියන් විසින් වින්දිත දරුවාට සිදු කරන ලද මෙම ක්‍රියාව මගින්, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය යටතේ සහතික කර ඇති "කිසිම තැනැත්තකු වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය" යන මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බව නිගමනය කරනු ලැබේ.

පාසල් පරිපාලන මට්ටමින් සිසුන් ශාරීරික දඬුවම්වලින් සුරක්ෂිත කිරීමේ සහ ඔවුන් උදෙසා ආරක්ෂිත අධ්‍යාපන පරිසරයක් නිර්මාණය කිරීමේ මූලික වගකීම විදුහල්පතිවරයා වෙත පැවරෙන පසුබිමක, දෙවන වගඋත්තර විදුහල්පතිනිය සිය ව්‍යවස්ථාපිත වගකීම පැහැර හැර ඇති බව නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම, මෙම සිදුවීම විධිමත් විමර්ශනයකට ලක් කර වින්දිත දරුවාගේ ආරක්ෂාව තහවුරු කරනු වෙනුවට, පාසලේ කීර්තිනාමය ආරක්ෂා කර ගැනීමේ අරමුණින් සිද්ධිය යටපත් කිරීමට සහ එය සමථයකට පත් කිරීමට උත්සාහ කර ඇති බව පෙනී යයි.

එසේම, සිසුවා විසින් සිය අධ්‍යයන පැවරුම් (ගෙදර වැඩ) සම්පූර්ණ නොකිරීමේ කරුණ පදනම් කරගනිමින්, ගුරුවරයා විසින් සිදු කරන ලද මෙම පහරදීම සාධාරණීකරණය කිරීමට කටයුතු කිරීමත්, ඒ පිළිබඳව කලාප අධ්‍යාපන කාර්යාලය නිසි පරිදි දැනුවත් කිරීමට අපොහොසත් වීමත් තුළින් විදුහල්පතිනිය සිය පරිපාලනමය වගවීම පැහැර හැර ඇත. මෙම ක්‍රියාකලාපය හේතුවෙන් පාසල් පරිසරය තුළ වින්දිත දරුවාගේ අධ්‍යාපන අයිතිය, ආත්ම අභිමානය සහ මනෝ-සමාජීය යහපැවැත්ම උල්ලංඝනය වී තිබේ. ඒ අනුව දෙවන වගඋත්තර විදුහල්පතිනිය විසින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති "නීතිය ඉදිරියේ සමාන සැලකිලි ලැබීමේ සහ නීතියේ සමාන ආරක්ෂාව ලැබීමේ" මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බව නිගමනය කරනු ලැබේ.

පාසල තුළ "ස්ථානීය දෙමාපියන්" (In Loco Parentis) ලෙස කටයුතු කිරීමේ නෛතික වගකීම සහිත පන්ති භාර ගුරුතුමිය වන හසකලාණි හිමංගන පෙරේරා මෙනවිය (තෙවන වගඋත්තර), අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 12/2016 හා 2012/37 දරන චක්‍රලේඛවල ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී ඇති බව නිගමනය කරනු ලැබේ.

ඒ අනුව, පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර සිටී.

1. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්,පළමුවන වගඋත්තර පූජ්‍ය ශ්‍රී පුර සරණතිස්ස හිමියන් විසින් සිදු කරන ලද මෙම ශාරීරික සහ මානසික වධහිංසා සම්බන්ධයෙන් සුදුසු පරීක්ෂණයක් ආරම්භ කර, ඒ අනුව සුදුසු පියවර ගත යුතුය.

2. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, දෙවන වගඋත්තර විදුහල්පතිනිය විසින් චක්‍රලේඛ විධිවිධාන උල්ලංඝනය කරමින් සිද්ධිය වසන් කිරීමට උත්සාහ කිරීම, වින්දිත දරුවාගේ ආරක්ෂාව තහවුරු කිරීමට අපොහොසත් වීම සහ පක්ෂග්‍රාහීව කටයුතු කිරීම යන පරිපාලනමය දුර්වලතා පිළිබඳව විමර්ශනයක් පවත්වා සුදුසු පියවර ගත යුතුය.

3. වින්දිත දරුවාගේ අඛණ්ඩ අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කිරීම උදෙසා, අධ්‍යාපන අමාත්‍යාංශය සහ කොළඹ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඔහු මෙතෙක් අධ්‍යාපනය ලැබූ ඉංග්‍රීසි මාධ්‍ය පහසුකම් සහිත නව පාසලක් සති දෙකක් (14) ඇතුළත ලබා දීමට පියවර ගත යුතුය.

4. කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය තුළ පවතින ශාරීරික දඬුවම් පැමිණවීමේ සංස්කෘතිය ඉවත් කිරීම සඳහා, අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 12/2016 සහ 2012/37 දරන චක්‍රලේඛවල අන්තර්ගතය පිළිබඳව සමස්ත ගුරු මණ්ඩලය දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනක් කොළඹ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය.

2026.04.28 දින පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වගන්ති ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :

1. අමාත්‍යතුමිය
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල. - කා.දැ.ගැ.ස

2. ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය,බත්තරමුල්ල. - නිර්දේශ ප්‍රකාරව සුදුසු පියවර ගැනීම සඳහා